# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2410/04 - 2024 නොවැම්බර් මස 13 වැනි බදාදා - 2024.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2023/27.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

වෛද්‍යා රම්‍යා ලීලාංගනී ප්‍රේමරත්න මිය, අංක 40, යුනිවර්සල් පාර්ක්, ගල්වරුස පාර, අතුරුගිරිය.

*සහ*

ආවේ මරියා හොස්පිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 01, ආවේ මරියා පාර, මීගමුව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර දකුණ, රාමනායක මාවත, දෙවන පටුමඟ, අංක 49/87, නීතිඥ එම්.කේ.ඒ.වී. නීලමනී මහත්මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය .

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.


1A - G 043060 - 09 (2024/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2023/27.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

වෛද්‍ය රම්‍යා ලීලාංගනී ප්‍රේමරත්න මිය, අංක 40, යුනිවර්සල් පාර්ක්, ගල්වරුස පාර, අතුරුගිරිය.

සහ

ආවේ මරියා හොස්පිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 01, ආවේ මරියා පාර, මීගමුව.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"අවේ මරියා හොස්පිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්හි නේවාසික වෛද්‍ය නිලධාරී ලෙස සේවය කරන ලද වෛද්‍ය රම්‍යා ලීලාංගනී ප්‍රේමරත්න මහත්මියගේ සේවය ඇයට ලබාදී ඇති සේවා ගිවිසුමේ කාලයට ප්‍රථමව කිසිදු හේතුවකින් තොරව අවසන් කිරීම මගින් ඇයට අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, ඒසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0080

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.